ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2000 අංක 51 දරන සමස්ත ලංකා ජෙම්මියාතුල් උලමා (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කලේ 2000 අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 අගෝස්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.50 යි.  තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

**2000 අංක 51 දරන සමස්ත ලංකා ජෙම්මියාතුල් උලමා (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වන දින.]

එල්. ඩී.– ඕ. 23/98.

**සමස්ත ලංකා ජෙම්මියාතුල් උලමා සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"සමස්ත ලංකා ජෙම්මියාතුල් උලමා" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියළු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කොට සහ ඉටුකර ඇති හෙයින් ද එම සංගමය සංස්ථාගත කරනු ලැබීම පිණිස ඉල්ලීමක් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2000 අංක 51 දරන සමස්ත ලංකා ජෙම්මියාතුල් උලමා (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු ඇතැම් විට "ජෙම්මියා" යනුවෙන් සඳහන් කරනු ලබන) සමස්ත ලංකා ජෙම්මියාතුල් උලමා හි සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන්, (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සමස්ත ලංකා ජෙම්මියාතුල් උලමා" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද , ඊට විරුද්ධව ද සියළු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා එය පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. සමස්ත ලංකා ජෙම්මියාතුල් උලමා සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) 'ධීන් අල් ඉස්ලාම්' (ඉස්ලාම් දහමේ දෘෂ්ටිය) ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම ;

(ආ) පොදුවේ මුස්ලිම් ප්‍රජාව සහ විශේෂයෙන් උලමාවරුන් (ඉස්ලාම් දේවධර්ම ශාස්ත්‍රඥයන්) අතර සමගිය ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම ;

(ඇ) ඉස්ලාම් ධර්මයට අනුකූලව මුස්ලිම්වරුන්ගේ සංස්කෘතික, සාමාජයීය සහ ආර්ථික ශුභ සිද්ධිය ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) ප්‍රථම දේශන සාමූහික යාඥා මෙහෙයයන් සංවිධානය කිරීම හා සමායෝජනය කිරීම ;

(ඉ) මුස්ලිම්වරුන් සහ වෙනත් ආගම් අදහන තැනැත්තන්ට ඉස්ලාම් ධර්මය පිළිබඳව මනා අවබෝධයක් ලබාදීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පොත්, වාර පුවත්පත් සහ වාර සඟරා ආදිය ප්‍රකාශයට පත් කිරීම සහ අංග සම්පූර්ණ පුස්තකාලයක් හෝ පුස්තකාල ස්ථාපනය කිරීම ;

(ඊ) අරාබි භාෂාව අධ්‍යයන කිරීම ප්‍රවර්ධනය කිරීම ;

(උ) ජන වර්ග අතර සමගිය ප්‍රවර්ධනය කිරීම ;

(ඌ) ජනරජයේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කවල සංස්ථාවේ ශාඛා සහ උපශාඛා පිහිටුවීම ;

(එ) සංස්ථාවේ පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය, ආනුෂංගික හෝ හේතුභූත වන වෙනත් සියලු ක්‍රියා හෝ දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීම හා එකතු කිරීම, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටුකරගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන්

සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කරවීම සහ සේවයෙන් පහ කිරීම ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වන්නා වූ සියලු ක්‍රියා, කාරණා සහ දේවල් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සිදු කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත්කරගනු ලබන පුද්ගලයන් සංඛ්‍යාවකින් සමන්විත වූ විධායක කමිටුවක් මගින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙරාතුවම වූ දිනයේ දී ජෙම්මියා හි විධායක කමිටුව, සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවෙහි කටයුතු කිරීමෙහි ලා අනුගමනය කල යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන්ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එවැනි රීති සාදනු ලැබීමෙන් පසු එවැනිම රැස්වීමකදී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ජෙම්මියාහි බලපැවැත්වූ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවනතාක් දුරට මේ වගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ රීති ලෙස සළකනු ලැබිය යුතු අතර, ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම (1) වන උප වගන්තියේ සඳහන් පරිදි එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියළුම සාමාජිකයෝ තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තාහ.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ජෙම්මියාහි පැවැති සියළුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට ජෙම්මියාහට අයවිය යුතුව තිබුණු සියළු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**8.** විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කළ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හා ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය හෝ සංස්ථාගත මණ්ඩලයක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුලත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකුලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකුලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.